# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1546 / 2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2023 திகதி

දිනය
Date } 09/12/2023 පැය 1045

**මාධ්‍ය නිවේදනය**

## 01. කුෂ් මත්ද්‍රව්‍ය තොගයක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය.

බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාසයේ නිලධාරින්ට ලද තොරතුරකට 2023.12.08 වන දින දහවල් කාලයේ දී කටුනායක ගුවන්තොටුපළ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපළ ඒකකයේ නිලධාරින් සහ රේගු මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ නිලධාරින් එක්ව කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේ සිදුකල වැටලීමකදී අයිතිකරුවෙකු නොමැති ගමන් මල්ලක් තුල තිබී කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 19 ග්‍රෑම් 589 ක් අත්අඩංගුවට ගෙන ඇත.

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2023.12.08 වන දින සවස් කාලයේ දී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මට්ටක්කුලිය පොලිස් වසමේ සමිත්පුර ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 510 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මට්ටක්කුලිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 03. ගින්නකට හසුවී කාන්තාවක් මිය යාමක් - මැදිරිගිරිය පොලිස් වසම.

2023.12.08 වන දින රාත්‍රි කාලයේ මැදිරිගිරිය පොලිස් වසමේ විහාරගම ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් පිළිස්සී මියගොස් ඇති බවට ලද තොරතුරක් මත මැදිරිගිරිය පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 67 ක් වූ විහාරගම, දිවුලන්කඩවල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය මානසික රෝගී තත්වයක් සඳහා ප්‍රතිකාර ලබාගනිමින් සිටින අතර වයස අවුරුදු 44 ක තම පුත්‍රයා සමඟ නිවසේ පදිංචිව සිට ඇති බවත් තම පුත්‍රයා නිවසින් බැහැරව ගිය අවස්ථාවකදී මෙම අනතුරට මුහුණපා ඇති බවටත් දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර ගින්නට හේතුව මෙතෙක් තහවුරුවී නොමැත.

මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය මැදිරිගිරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධිය සම්බන්ධයෙන් මැදිරිගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2023.12.08 වන දින සවස් කාලයේ මීගමුව පොලිස් වසමේ පුත්තලම කොළඹ ප්‍රධාන මාර්ගයේ ගල්කන්ද හන්දිය ආසන්නයේදී කොළඹ දෙස සිට හලාවත දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා වම්පස සිට දකුණු පසට හැරවීමට ගිය තවත් යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරුවන් දෙදෙනා මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී එක් යතුරුපැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 59 ක් වූ මීගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මීගමුව පොලිස් වසම.

2023.12.08 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ මීගමුව නගරයේ ප්‍රධාන වීදියේ දී මීගමුව නගරය දෙස සිට කොප්පරා හන්දිය දෙසට ධාවනය කළ ජීප් රථයක් ඉදිරියෙන් එම දිසාවටම ගමන් කල පාපැදියක පිටුපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පා පැදිකරු මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරින් පසු ජීප් රථය පලාගොස් ඇති අතර එම ජීප් රථය කටාන පොලිස් වසමේ නුගවෙල, වයි හන්දිය ආසන්නයේ දමාගොස් තිබියදී සොයාගෙන ඇති අතර, සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**